(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 131.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 පෙබරවාරි 18 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1466/2025

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැවිලි වතුවල සේවකයින් වන සතුන්ගේ ප්‍රහාරයන්ට ගොදුරුවීම්, සර්පයින් හා බඹරුන්ගේ දෂ්ට කිරීම් සහ රසායනික ද්‍රව්‍ය නිසා සිදු වන අනතුරුවලට ලක් වන බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් පැමිණිලි ලැබෙන්නේද;

(iii) එසේ නම්, පසුගිය වසර පහ තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත අනතුරුවලින් සේවකයින් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැවිලි වතු සේවකයින් සේවා ස්ථානවලදී සේවායෝජකයින්ගෙන් වාචික, ශාරීරික හෝ වෙනත් ආකාරයෙන් හිංසනයට ලක් වන බව දන්නේද;

(ii) එම හිංසන වළක්වා ගැනීම සඳහා නීතිමය පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1500/2025

ගරු බී. ආරියවංශ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වතු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම වතු නිවාස සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වතු නිවාස සංවර්ධනය කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1542/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටියන්තොට, නාගස්තැන්න වතු යාය මේ වනවිට අයත් වන්නේ කවුරුන්ටද;

(ii) එම වතු යායේ කළමනාකරණය ප්‍රශස්ථ මට්ටමක තිබේද;

(iii) එම වතු යායේ ඉඩම් පෞද්ගලික පාර්ශ්වයන් විසින් අත්පත් කර ගන්නා බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ආර්ථික, පාරිසරික හා සමාජීය වශයෙන් වටිනා ඉහත වතු යායේ ඉඩම් සංවර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1576/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේදී ඉන්දියානු රජය විසින් මලයගම් ජනතාව වෙනුවෙන් 'සිටි රයිඩර්' බස් රථ ලබා දුන් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම බස් රථ ලබාදීමේ අරමුණ කවරේද;

(iv) එම බස් රථ ලබා දුන් සංවිධාන සහ ඒවා ලබාගත් අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(v) එම බස් රථවලින් බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක සඳහා ලබා දුන් බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම බස් රථවල වර්තමාන තත්ත්වය කවරේද;

(vii) එම බස් රථ මේ වනවිට භාවිතා කරනු ලබන පාර්ශ්ව සහ භාවිතා කරනු ලබන කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1637/2025

ගරු රුවන් විජේවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'සැමට සෙවන' ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව සහ සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

(iii) මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී යොදා ගන්නා ලද නිර්ණායක කවරේද;

(iv) මෙම ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) ඒ සඳහා වෙන් කරන ලද මුදල සහ සත්‍ය වශයෙන් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1664/2025

ගරු සංජීව රණසිංහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කළුතර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්වලින්, බදු පදනම මත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, මහජනතාව වෙත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය, නිදහස් ඔප්පු ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය සහ බලපත්‍ර මඟින් මහජනතාව වෙත ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බලපත්‍රලාභී ඉඩම් සඳහා නිදහස් ඔප්පු ලබාදීමේ හැකියාවක් තිබෙන්නේද;

(iv) මහජනතාව වෙනුවෙන් ලබාදී ඇති ඉඩම්වලින්, ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා ඇති ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ඉඩම් නැවත පවරාගෙන, ඉඩම් නොමැති අය සඳහා ලබාදීමේ හැකියාවක් තිබෙන්නේද;

(vi) පුද්ගලයන් හෝ ආයතන විසින්, අයථා ලෙස අත්පත් කරගෙන ඇති, කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1696/2025

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාණිජ කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය යොදා ගැනීම සම්බන්ධව දැනට පවතින නීති සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන අංශ කවරේද;

(ii) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීමේ සහ නිකුත් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iii) ඒවා ක්‍රියාත්මක කරන නිලධාරින්ගේ තනතුරු කවරේද;

(iv) ඒ සඳහා දිස්ත්‍රික්ක භාර සහකාර නිලධාරින් පත් කර තිබේ නම්, ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

(v) මේ වනවිට වෙඩි බෙහෙත් පාලක තනතුර පුරප්පාඩුවී තිබේද;

(vi) එම පුරප්පාඩුව පිරවීමට කටයුතු කරන්නේද;

(vii) ඉහත තනතුරට දෙවන පෙළ නිලධාරින් සූදානම් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වාණිජමය පදනම මත නිකුත් කර ඇති පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර සහ මේ වනවිට ක්‍රියාකාරි බලපත්‍රලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම බලපත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

(iii) එම බලපත්‍ර නියාමනය කරන්නේද;

(iv) පුපුරණ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා යොදා ගන්නා පෞද්ගලික මධ්‍යස්ථාන කවරේද;

(v) ඒවායේ ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර කවරේද;

(vi) බලපත්‍රලාභියෙකුට වරකට නිකුත් කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1720/2025

ගරු ඕෂානි උමංගා මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු දෙපාර්තමේන්තුවේ, පැමිණිලි අංශය විසින් පැමිණිල්ලක් විසඳීම සඳහා ගත වන සාමාන්‍ය කාලය කොපමණද;

(ii) මේ වනවිට, එම අංශයේ පවතින නොවිසඳුනු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි කඩිනමින් හා ඵලදායිව විසඳීම සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1739/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) (i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සුනාමියෙන් පසුව ප්‍රතිසංස්කරණය කළ ධීවර ගොඩනැගිලි ඇති බවත්;

(ii) එම ගොඩනැගිලි අතරින් කුලී සහ බදු පදනම මත ලබා දෙන ලද සහ විකුණන ලද ධීවර ගොඩනැගිලි ඇති බවත්;

(iii) එම ගොඩනැගිලි අතරින් මේ දක්වා භාවිතා නොකරන ලද ගොඩනැගිලි ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(iii)හි සඳහන් ධීවර ගොඩනැගිලි රජයේ සහ පොදු අවශ්‍යතාවයන් සඳහා ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) සුළු පන්න ධීවර සම්මේලනය මඟින් සුනාමියෙන් පසුව ජලාල්ඩීන් චතුරස්‍රය සහ කනකර් ග්‍රාම නිලධාරි වසම්වල ඉදිකළ ධීවර බහු කාර්ය ගොඩනැගිලි භාරව කටයුතු කරන, ආදායම් අය කරන සහ නඩත්තු කටයුතු කරන පාර්ශ්වයන් කවරේද;

(iii) ඉහත ගොඩනැගිලි පරිශ්‍රයන්හි අයිතිකරුවන් හඳුනාගතහොත්, ඔවුන්ට පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විකල්ප ඉඩම් ලබා දීමෙන්, මෙම ධීවර බහු කාර්ය ගොඩනැගිලි පොතුවිල් ප්‍රාදේශීය සභාවට හෝ මහජන භාවිතයට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1809/2026

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අසාධාරණයට ලක්වූ තැන්පත්කරුවන්ගෙන් ගම්පහ සණස බැංකුව සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, එම පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම පැමිණිලි පොලීසිය වෙත ලැබුණු දිනය එක් එක් පැමිණිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය විසින් මේ දක්වා සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

(v) සණස බැංකුව මඟින් ණය ලබාගෙන ඇති Gampaha Development Company (PVT) Ltd, (GDC) ආයතනය සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(vi) එසේ නම්, එම පැමිණිලි සම්බන්ධයෙන් මේ දක්වා සිදු කර ඇති විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී
### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද,— ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රියාස් ෆාරුක් මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2026 පෙබරවාරි 05 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

2.

ගරු චාමර සම්පත් දසනායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි"

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2(3) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 25 දිනැති අංක 2464/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 04 දිනැති අංක 2465/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 31 දිනැති අංක 2469/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2026.02.05 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 නොවැම්බර් 25 දිනැති අංක 2464/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය).

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වගන්තිය සමඟ කියවිය යුතු 44, 123, 124, 125, 126, 126ආ, 128, 132, 132අ සහ 231 වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 දෙසැම්බර් 17 දිනැති අංක 2467/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.02.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*14.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

15.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

***  සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

1845/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1970 සිට 2025 දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සිදුවී ඇති මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව;

(ii) එම කාලය තුළ සිදුවී ඇති ස්ත්‍රී දූෂණ සිද්ධීන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1846/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම දේවාලය සතු ස්වර්ණාභරණ සහ අනෙකුත් රන් භාණ්ඩවල සම්පූර්ණ රත්තරන් බර කොපමණද;

(ii) එම ස්වර්ණාභරණ සම්පූර්ණයෙන් හෝ කොටසක් විකුණා එම මුදල් රජයට භාරදීමට යෝජනාවක් ඉදිරිපත්වී තිබේද;

(iii) එසේ නම්, එම රන් භාණ්ඩ වෙන්දේසිය තෙක් ආරක්ෂිතව තබා ගැනීම සඳහා ගෙන ඇති පියවර මොනවාද;

(iv) එම රන් භාණ්ඩ විකිණීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂා කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1847/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2025 දක්වා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් මුදාහැර ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2026 වර්ෂය සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉල්ලා ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව දැනට මුදාහැර ඇති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) කොමිෂන් සභාවේ කටයුතු සඳහා පරීක්ෂණ නිලධාරීන්ගේ හිඟයක් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, එම හිඟය පියවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1848/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2025 දක්වා කාලය තුළ එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වාර්තාවී ඇති වෙඩි තැබීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ වෙඩි තැබීම් හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව සහ තුවාල ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම වෙඩි තැබීම් පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් ගෙන ඇති පියවර සහ එහි ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරගම පොලිසිය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල පැරණි සහ අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) එම පොලිසිය සඳහා පහසුකම් සහිත නවීන ගොඩනැගිල්ලක අවශ්‍යතාවයක් පවතින බව පිළිගන්නේද;

(iii) බණ්ඩාරගම පොලිස් පරිශ්‍රය වැඩි දියුණු කිරීම සඳහා ගොඩනැගිලි සැලැස්මක් පිළියෙළ කර තිබේද;

(iv) එසේ නම්, එහි අපේක්ෂිත පිරිවැය කොපමණද;

(v) නිල නිවාස අවශ්‍යතාවය විසඳීමට බණ්ඩාරගම පොලිසියේ පරිශ්‍රය තුළ නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ හැකියාව සම්බන්ධව අධ්‍යයනයක් කර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1849/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ණය සහනදායක ආඥාපනත සහ එහි කාර්ය පටිපාටිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ 2025.07.15 දිනැති වාර්තාව ලැබී තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iii) එම කමිටු වාර්තාවේ සඳහන් ප්‍රධාන නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ අනුව මේ වනවිට සිදු කොට ඇති පරිපාලන වෙනස්කම් කවරේද;

(v) කමිටු වාර්තාවේ නිර්දේශ අනුව සිදු කිරීමට අපේක්ෂිත නීතිමය සංශෝධන කවරේද;

(vi) එම සංශෝධන සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ණය සහනදායක මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) ණය සහනදායක මණ්ඩලයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව කොපමණද;

(iv) 2026 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලය වෙනුවෙන් රජය විසින් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1850/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නිරතුරුවම ජලගැලීම්වලට ලක්වන බැවින්, එම ප්‍රදේශයට භාණ්ඩ සහ සේවා සැපයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දැනට අර්ධ වශයෙන් ඉදිකර වැඩ නතර කර ඇති දක්ෂිණ අධිවේගී මාර්ගයේ පැල්පොල අන්තර් හුවමාරුව ඉදිකර අවසන් කළ යුතු බව 2025.12.11 දින පැවති යටිතල පහසුකම් සහ උපායමාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී තීරණය කර ඇති බව දන්නේද;

(ii) මිල්ලනිය, කළුතර උතුර සහ බුලත්සිංහල ප්‍රදේශවල ජනතාවට දක්ෂිණ අධිවේගී මාර්ගයට ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැති බව පිළිගන්නේද;

(iii) දැනට අඩක් වැඩ නිමකර ඇති පැල්පොල අන්තර් හුවමාරුවේ කටයුතු අවසන් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7\.

1851/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1989.11.13 වන දින ඝාතනය කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර මහතාගේ මරණයෙන් පසු, ඔහුගේ බිරිඳ සහ දරුවන්ව ආරක්ෂා කිරීම සඳහා රජයේ රැකවරණය ලබාදීමට රජය විසින් කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එලෙස රජයේ රැකවරණය ලබා දුන් තැනැත්තන්, රෝහණ විජේවීර මහතා සමග තිබූ ඥාති සම්බන්ධතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තැනැත්තන් රඳවාගෙන සිටි ස්ථාන කවරේද;

(iv) වර්තමානයේ රජයේ රැකවරණය සහ නඩත්තු ලබන රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන් කවුරුන්ද;

(v) රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන්ගේ නඩත්තුව සඳහා මෙතෙක් රජය විසින් දරා ඇති ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(vi) වර්තමානයේ රජයේ රැකවරණය ලබන එම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව සහ නඩත්තුව සඳහා මසකට රජය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?